# ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
# පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

## පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ ද්විභාෂා ලිපිකරු තනතුරේ III ශ්‍රේණිය සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ III ශ්‍රේණියේ ද්විභාෂා ලිපිකරු තනතුරේ පවතින පුරප්පාඩු 15ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. බඳවා ගැනීමේ ක්‍රමය:

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සඳහා පමණක් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත එම පරීක්ෂණයෙන් සමත්වීමේ අවම ලකුණු ප්‍රමාණය ඉක්මවන අයදුම්කරුවන් අතුරින් පිළිවෙලින් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගනු ලැබේ.

### 02. සුදුසුකම්:

#### 2.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම.

**සහ**

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී පහත සඳහන් **එක් සුදුසුකමක්** සපුරා තිබීම.

(i) අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව සිංහල නම් දෙවන බස දෙමළ සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම.

(ii) අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව දෙමළ නම් දෙවන බස සිංහල සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම.

(iii) අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව ඉංග්‍රීසි නම් සිංහල භාෂාව/ භාෂාව හා සාහිත්‍යය හෝ දෙමළ භාෂාව/ භාෂාව සහ සාහිත්‍යය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් තිබීම.

**සහ**

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) සමත්ව තිබීම.

#### 2.2 කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

2.3 **වෙනත් සුදුසුකම්:**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන I :** මූලික අධ්‍යාපන සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල (අ.පො.ස. සාමාන්‍ය පෙළ හා අ.පො.ස. උසස් පෙළ) අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතු ය.

**03. වයස් සීමාව:**

අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ.

II. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්ය. III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

III. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබාගත යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත් විය යුතුවේ.

V. අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**05. වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 45,230-10×540-11×630-10×890-10×1,190 - 78,360/- (MN 1-2025) ක් වන අතර එම වැටුප හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

**06. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.** (පරීක්ෂණයෙන් සමත්වීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය ලකුණු 35කි)

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| **01.** | **මූලික සුදුසුකම්වලට අතිරේකව ලබා ඇති භාෂා ප්‍රවීණතාවය :** | | **40** |
| | 01. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ | | |
| | I. අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව සිංහල නම් | | |
| | (i) දෙවන බස දෙමළ | | |
| | - A සාමාර්ථයක් සඳහා | 10 | |
| | - B සාමාර්ථයක් සඳහා | 08 | |
| | - C සාමාර්ථයක් සඳහා | 05 | |
| | (ii) ඉංග්‍රීසි භාෂාව | | |
| | - A සාමාර්ථයක් සඳහා | 10 | |
| | - B සාමාර්ථයක් සඳහා | 08 | |
| | - C සාමාර්ථයක් සඳහා | 05 | |
| | II. අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව දෙමළ නම් | | |
| | (i) දෙවන බස සිංහල | | |
| | - A සාමාර්ථයක් සඳහා | 10 | |
| | - B සාමාර්ථයක් සඳහා | 08 | |
| | - C සාමාර්ථයක් සඳහා | 05 | |
| | (ii) ඉංග්‍රීසි භාෂාව | | |
| | - A සාමාර්ථයක් සඳහා | 10 | |
| | - B සාමාර්ථයක් සඳහා | 08 | |
| | - C සාමාර්ථයක් සඳහා | 05 | |
| | III. අයදුම්කරුගේ මාධ්‍ය භාෂාව ඉංග්‍රීසි නම් | | |
| | (i) දෙවන බස සිංහල | | |
| | - A සාමාර්ථයක් සඳහා | 10 | |
| | - B සාමාර්ථයක් සඳහා | 08 | |
| | - C සාමාර්ථයක් සඳහා | 05 | |
| | (ii) දෙවන බස දෙමළ | | |
| | - A සාමාර්ථයක් සඳහා | 10 | |
| | - B සාමාර්ථයක් සඳහා | 08 | |
| | - C සාමාර්ථයක් සඳහා | 05 | |
| | 02. රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාගත් අදාල භාෂා පිළිබඳ පාඨමාලාවක් සඳහා | | |
| | - මාස 03කට නොඅඩු | 05 | |
| | - මාස 06කට නොඅඩු | 10 | |
| | - අවුරුදු 01 හෝ ඊට වැඩි | 20 | |
| | **(අංක 02 හි උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)** | | |
| **02.** | **ත්‍රෛභාෂාවෙන් කටයුතු කිරීම පිළිබඳ ලබා ඇති සේවා පළපුරුද්ද:** | | **30** |
| | සේවා කාලය මාස 06කට නොඅඩු කාලසීමාවක් සඳහා ලකුණු 05 බැගින් | | |
| | (ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ හෝ පෞද්ගලික අංශයේ නිලධාරීන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමේදී, ත්‍රෛභාෂාවෙන් ලබා ඇති සේවා පළපුරුද්ද, තම ආයතන ප්‍රධානියා මඟින් ලබා ගත් සේවා සහතිකයකින් සනාථ කල යුතුයි. ) | | |

| | | | |
|---|---|---|---|
| **03.** | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම**<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලාවක් සඳහා<br>- මාස 03කට නොඅඩු<br>- මාස 06කට නොඅඩු<br>- අවුරුදු 01 හෝ ඊට වැඩි<br><br>**(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)** | <br><br><br>05<br>10<br>20 | **20** |
| **04.** | **සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් භාෂා ප්‍රවීණතාව මැන බැලීම සඳහා විමසනු ලබන ප්‍රශ්න 05**<br><br>සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් භාෂා ප්‍රවීණතාවය මැන බැලීම සඳහා විමසනු ලබන ප්‍රශ්න 05ක් සඳහා, එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් | | **05** |
| **05.** | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතා හා පෞරුෂය**<br><br>I. සාමාන්‍ය දැනීම හා බුද්ධිය<br>II. භාෂාව හැසිරවීම පිළිබඳ දැනුම<br>III. පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ පෞරුෂත්වය | <br><br>02<br>02<br>01 | **05** |
| **06.** | **මුළු එකතුව** | | **100** |

සටහන **II** - යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍රවලට අදාළ කාල සීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ.

**07. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:**

යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි.

සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් සහ අයදුම්කරු විසින් ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii) වලංගු රියදුරු බලපත්‍රය

**08. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

I. අයදුම්පත් 2026.04.06 දිනට හෝ ඊට පෙර "කොමසාරිස් ජනරාල්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සුහුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත භාවිතා කරමින් සකස් කර මුල් පිටුව අංක 01 සිට අංක 08 දක්වාත් දෙවැනි පිටුව අංක 09 සිට අංක 10 දක්වාත් තෙවැනි පිටුව අංක 11 සිට අංක 14 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

III. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිඳු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

IV. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ද්විභාෂා ලිපිකරු තනතුරේ III ශ්‍රේණිය සඳහා අයදුම් කිරීම" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

V. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු.82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

VI. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම:**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවය අවසන් කිරීමට / සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**11.** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් සතු වේ.

**12.** අයදුම්පත්‍රය drp.gov.lk වෙබ් අඩවිය ඔස්සේ ද බාගත කළ හැකිය.

කොමසාරිස් ජනරාල්
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

2026 පෙබරවාරි මස 24 වැනි දින
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.